# ආවරණ ධර්ම - සෝවාන් පුද්ගලයා - සංඝ භේදය

## 11.02.2018 - ශ්‍රී ලංකාරාමය

## නවසීලන්තය

අද මේ පින්වතුන්ට අපි විශේෂ ධර්ම කරුණු ටිකක් කියල දෙනවා. මේ පිංවතුන්ගේ ජීවිත දිහා බලන්නත් තමන් ඇසුරු කරන අයගේ ජීවිත පිළිබඳව තේරුම් ගන්නත්. අපි හැම එක්කෙනාම සෝවාන් ආදී මාර්ග ඵල ධර්මයන් ප්‍රතිවේධ කරගෙන සසර දුකෙන් මිදිලා නිවන් අවබෝධ කරගන්න කැමති, ඒ සඳහා ඡන්දය තිබෙන, ඒ සඳහා උත්සාහය දරන්නා වූ පිරිසක්. ඒකනිසා තමයි ගෙවල්වල තිබෙන වැඩ කටයුතු ටික වෙලාවකට අමතක කරලා දාල ඒවා අතහැරලා තමන්ගේ ඒ කටයුතු වලින් බැහැර වෙලා සේනාසනයට ඇවිල්ල ඉන්නේ ඒ විමුක්තිය හොයාගෙන.

විමුක්තිය කියල කියන්නේ ඇත්ත වශයෙන්ම මේ පංචස්කන්ධයෙන් මිදිලා යෑමයි. ඒ කියන්නේ හිතෙන් මිදෙන්න - රූපයෙන් මිදෙන්න - වේදනාවල් දැනෙන ගතියෙන් මිදෙන්න - සංඥාවෙන් සංඛාරයෙන් මිදෙන්න තමයි අපේ බලාපොරොත්තුව. මේ තියෙන ස්කන්ධ පහෙන් ගැලවෙන්න මාර්ගයක් හොයාගෙන යන්න. මේකෙන් ගැලවෙන්න නම් මේකේ අස්සෙම ඕන වැඩ කරවන්න. පංචස්කන්ධය එපා - පංච උපාදානස්කන්ධය එපා කියන එක හැබෑව. ඒ උනාට ඒක නැති කරන්න පිටින් ශක්තියක් ගන්න බෑ. ඇතුලෙන්ම ඕන ඒ ශක්තිය උපද්දවල ඒක තුලින්ම ඕන මේක නවත්ත ගන්න. ඒකට උත්සාහයක් තමයි මේ දරන්නේ.

බුදුරජාණන්වහන්සේ එක අවස්ථාවක දේශනා කරනවා **'ආවරණ ධර්ම'** ටිකක්. දැන් අපි බණ අහනවා ධර්ම සාකච්ඡා කරනවා වන්දනා ගමන් යනවා භාවනා කරනවා. මේ ඔක්කොම කරන්නේ ධර්ම අවබෝධය කරන්නනේ. හැබැයි ධර්ම අවබෝධය කරගන්ට, ඒ කියන්නේ ධර්මය ප්‍රත්‍යක්ෂ කර ගන්න - ධර්මය තේරුම් ගන්න - ධර්මය හොඳට දකින්න. ධර්මය දකින්න තමයි බණ අහන්නේ - ධර්මය දකින්න තමයි ධර්ම සාකච්ඡා කරන්නේ. ධර්මය දකින්න තමයි අපි භාවනා කරන්නේ. එහෙම භාවනා කරත් අපිට ඒ ධර්මය යම්කිසි කාරණයක් නිසා පෙන්නේ නැතුව යනවා - වැහෙනවා. අපි භාවනා

කරලා දකින්න උත්සාහකරන ධර්ම 'වහන ධර්ම' වලට කියනවා **'ආවරණ ධර්ම'** කියල. ඒ ආවරණ ධර්ම තියෙනවා කීපයක්. එවානම්

1) **'කම්මාවරණතාය සමන්නාගතො හොති'** - (පංචානන්තරිය කම්ම)

කර්මාවරණයක් යෙදිලා තියෙනවා. කර්මාවරණයෙන් යුක්ත වෙච්ච කෙනා බණ අහනවා. කර්මාවරණයෙන් යුක්ත වෙච්ච කෙනා සිල් රකිනවා. කර්මාවරණයෙන් යුක්ත වෙච්ච කෙනා සාකච්ඡා කරනවා - භාවනා කරනවා හැබැයි ධර්ම අවබෝධය වෙන්නේ නෑ. එහෙම එකක් තියෙනවා.

2) **'කිළෙසාවරණතාය සමන්නාගතො හොති' - (නියත මිත්‍යා දෘෂ්ඨිය - උච්ඡේදවාදය)**

කෙලෙස් ආවරණයෙන් සමන්නාගත වූ කෙනාටත් මොන බණ ඇහුවත් මොකක්වත් අවබෝධ වෙන්නේ නැහැ.

3) **'විපාකාවරණතාය සමන්නාගතො හොති'** - ඒ කියන්නේ යම්කිසි විපාකයකින් ජීවිතය ආවරණය වෙලා තියෙන්නේ. එතකොටත් ධර්මය අවබෝධය වෙන්නේ නෑ.

4) **'අස්සද්ධො හොති'**

5) **'අච්ඡන්දිකො හොති'**

6) **'දුප්පඤ්ඤො හොති'**

දැන් මෙතන තියෙනවා ආවරණ ධර්ම 6 ක්. මොකක්ද **'කම්මාවරණතාය සමන්නාගතො හොති'** කියන්නේ කියලා අපි දැන ගන්න ඕනේ. දැන් අපි බණ අහනවා - රේඩියෝ එකෙත් අහනවා - රූප වාහිනියෙත් අහනවා - අරියධම්ම ස්වාමීන්වහන්සේගේ ඒවත් අහනවා - අපේ ඒවත් අහනවා - නොයෙක් නොයෙක් විදියට අහනවා. දැන් මේ මොන බණ ඇහුවත් අභිධර්මය සාකච්ඡා කරත් විනය සාකච්ඡා කරත් සූත්‍ර සාකච්ඡා කරත් මොනවා සාකච්ඡා කරත් **'කම්මාවරණතාය'** තියනවනම් ධර්මය අවබෝධ වෙන්නේ නෑ. කර්මයෙන් ආවරණය වෙලා තියෙන්නේ. කර්මයෙන්

ආවරණය වෙලා කියල කියන්නේ මොකක්ද ඒ කර්මය? සෝවාන් වෙන්නේ නැති - මාර්ග ඵල අවබෝධ වෙන්නේ නැති - ධ්‍යාන ලබා ගන්න බැරි කර්මය තමයි පංචානන්තරිය කර්මය. අම්ම මරල ඇවිල්ල අරලිය මල් ගොඩවල් පිටින් පූජා කරනවා. අවබෝධ වෙනවද ධර්මය? නෑ. බුදුරජාණන්වහන්සේ කර්මාවරණය වෙච්ච තැනක් මෙසේ සඳහන් කරනවා. බණ දේශනාවක් කරන වෙලාවේ භික්ෂූන් වහන්සේලාට කියනවා "මහණෙනි අජාසත්ත රජතුමා කර්මාවරණය ලබාගෙන තිබුනේ නැත්නම් පියා ඝාතනය කරලා තිබුනේ නැත්නම් අද මේ අහපු බණෙන් රජතුමා මාර්ගඵල අවබෝධ කර ගන්නවා කියල". ඒ තරම් වටිනා විසිතුරු වූ බණක් දේශනා කලේ. හැබැයි වැඩක් නෑ. ඒ කියන්නේ කොච්චර nutritious ආහාරයක් දුන්නත් එයාට ඒක දිරවගන්න බෑ. ඇයි ඒ? ඒක කර්මයෙන් ආවරණය කරලා තියෙන්නේ. දැන් බලන්න, බුදුරජාණන්වහන්සේ ඇතින්වත් දකින්න බැරුවනෙ අපි ඉන්නේ. එච්චර වටිනා ලොව්තුරා බුදුකෙනෙක් වැඩ ඉන්න විහාරයට ගිහිල්ල පාමුල වැඳ වැටිලා උන්වහන්සේගේ ශ්‍රී මුඛයෙන් අෂ්ඨාංග සමන්නාගත බ්‍රහ්මස්වරයෙන් දේශනා කරන ධර්මය - පද පේළි ලස්සනට දේශනා කරපු ධර්මය අහලත් ධර්මය අවබෝධ කරගන්න බැරි උනානේ. බලන්න කර්මාවරණයේ තිබෙන්නාවූ භයානක කම. කර්මාවරණය වෙච්ච කෙනාට මේ ජීවිතියේ ධර්මය අවබෝධ කරගන්ට බෑ.

**'ක්ලෙසාවරණතාය'** කියල කියන්නේ කෙලෙස්වලින් ආවරණ වීම. එයාට තියෙනවා මෙවැනි දෘෂ්ඨියක් - මීට ඉස්සර ජීවිතියක් තිබුනෙත් නෑ - මැරුණට පස්සෙත් ජීවිතියක් නෑ - කරන කර්ම වල විපාකයක් නෑ - හොඳ හෝ නරක මරණින් පස්සේ ඉවරයි කියල දෘෂ්ඨියක්. ඔහොම දෘෂ්ඨියක ඉඳගෙන හොඳට දේශනා කරන බණක් අහනව. හැබැයි ධර්මය අවබෝධ වෙන්නේ නෑ. දැන් ඔය සමහර වෙලාවට බුදුරජාණන්වහන්සේගේ බණ මිත්‍යා දෘෂ්ඨිකයෝ ලියනවා. සමහරු සූත්‍ර අරගෙන බුදුරජාණන්වහන්සේ මෙලොවක් පරලොවක් දේශනා කරේ නෑ කියලම ඒ ගොල්ලන්ගේ දෘෂ්ඨිය දාල ලියනවනේ. දවසක් මට පොතක් හම්බ උනා. ඒක ඉංග්‍රීසියෙන් තිබුනේ. මම පිටු දෙකක් තුනක් කියවල බැලුවහම එකේ තිබුනේ අමු මිත්‍යා දෘෂ්ඨියක්. බුදුරජාණන්වහන්සේගේ ධර්මය විස්තර කරන්න යන්නේ කර්මය කර්මඵලයවත් පිළිගන්නේ නැතුව. ඇයි එහෙම මිනුස්සු කරන්නේ? හේතුව බුද්ධ ධර්මය හරි ජනප්‍රියයි. මිනුස්සුන්ට බල කරන්නේ නැතුවම නිකම්ම බුද්ධ ධර්මය පැතිරෙනවා. ඒකනිසා ඒ මිනුස්සු කැමතියි ඒ අතරතුර පොතක් දෙකක් ලියල පොඩි ජනප්‍රියත්වයක් සහ පිළිගැනීමක් හදා ගන්න. ඒකටයි ඒ පොත් ලියන්නේ. නැතුව බණ කියන්නවත් බණ දෙසන්නවත් නෙමෙයි. දැන් ඒ අයට කොච්චර බණ කිව්වත් කොච්චර බණ ඇහුවත් ධර්මය අවබෝධ

කරගන්න බෑ. චුති ප්‍රතිසන්ධියක් එක්ක මෙලොවක් පරලොවක් තියෙනවා - මෙතනින් ගියාට පස්සේ එහා ලෝකයක උපදිනවා කියල පිළිගන්නේ නැති එක්කෙනාට කවමදාකවත් සෝවාන් ආදී මාර්ගඵල අවබෝධ වෙන්නේ නෑ. ඒකට කියනවා කෙලෙස් වලින් ආවරණය වීම කියල. නියත මිත්‍යාදෘෂ්ටිය කියලත් කියනවා උච්ඡේදවාදය කියලත් කියනවා.

**'විපාකාවරණතාය'** කියල කියන්නේ යම්කිසි කුසල හෝ අකුසල කර්මයක විපාකයකින් ආවරණය වීම. ඒක වෙන්නේ මෙහෙමයි. සමහර අය කියනවා ඒ අය බණ අහන වෙලාවට ගෙදර ඇති කරන බල්ලෝ බළල්ලු වැනි සතුනුත් බණ අහනවා කියල. නමුත් ඒ සත්තුන්ට ඒවා තේරෙන්නේ නෑ. අලින්ට ගොනුන්ට කුරුල්ලන්ට ආදී තිරිසන් සතුන්ට ධර්මය තේරෙන්නේ නැත්තේ ඒ සතාට කර්මයෙන් ඒක වලක්වලා ආවරණය කරලා තියෙන නිසා ඒක විපාක ආවරණයක්. සමහර මනුෂ්‍යයන්ටත් කුසල විපාක අහේතුක සිතකින් උපත්තියක් ලැබුවොත් ඒක විපාක ආවරණයක් වෙනවා. අඳ ගොලු බිහිරි ආදී අබාධ ඇති පුද්ගලයින්ට ධර්ම අවබෝධය කරගන්න බෑ. අපි කොච්චර මහන්සි ගත්තත් ඒගොල්ලන්ට සම අයිති වාසිකම් දෙන්න ඕන කියල - අපි කොච්චර කථා කරත් සම අයිතිවාසිකම් දෙන්න බෑ. කෑම බීම ප්‍රශ්නයක් නෑ. අපි කන බොන කෑම බීම දෙන්න පුළුවන් - අඳින පළඳින ඒවා දෙන්න පුළුවන් - සෙරෙප්පු සපත්තු දෙන්න පුළුවන් - අපි යන වාහන වල එක්කරගෙන යන්න පුළුවන්. ඒවා ඔක්කොම කරන්න පුළුවන්. හැබැයි මනසට දෙන දේවල් අනිත් අයට සමානව දී ගන්න බෑ. කුසල කර්මයක් කරන වෙලාවේදී හයියට ගැම්මට හිත යොදල කරලා නෑ. ඒකනිසා විපාක එනකොට එන්නේ දුර්වල විපාක. ඒ දුර්වල විපාක සිතකින් ඉපදුනාට පස්සේ එහෙම යමක් තේරුම් ගන්න පුළුවන් කමක් නෑ. ඒකට කියනවා විපාකයෙන් ආවරණය වෙලා කියල. දැන් බුදුරජාණන්වහන්සේගේ විහාරයට එන ඔක්කෝම නිවන් දැක්කේ නැනේ. කොච්චර කිව්වත් සමහර අයට තේරෙන්නේ නෑ. බුදුරජාණන්වහන්සේ උදායි කියන ස්වාමීන්වහන්සේට හැම වෙලේම 'මෝඝ' 'මෝඝ' කියන වචනේ තමයි කියල තියෙන්නේ. එහි තේරුම් 'හිස්' කියන එකයි.

අනිත් එක තමයි ශ්‍රද්ධාව නැති අය බණ ඇහුවට ධර්මය අවබෝධ වෙන්නේ නෑ. බුදුරජාණන්වහන්සේගේ ධර්මය පිළිගන්නේ නැති - ශික්ෂාවක් කැමැත්තෙන් රකින්න හිතින් භාර ගැනීමක් නැති - තුණුරුවන් පිළිගන්නේ නැති - කර්මය කර්ම ඵලය ලොකුවට පිළිගන්නේ නැති අය තුල ශ්‍රද්ධාව

පිහිටලා නෑ. ආන්න එහෙම අයට කියනවා **'අස්සද්ධො'** කියල. එහෙම අයට ධර්ම අවබෝධය වෙන්නේ නෑ.

අනිත් එක තමයි **'අච්ඡන්දි'** - අච්ඡන්දි කියන්නේ කුශලච්ඡන්දය නෑ කියන එකයි. ඒ කියන්නේ බණ අහල පිනක් කරගන්න ඕනේ - ධර්මයක් අවබෝධ කරගන්න ඕනේ කියල එහෙම කැමැත්තක් නෑ. සමහර මිනුස්සුත් එහෙම ඉන්නවා. ඔය උතුරුකුරු දිවයිනේ මිනිස්සු අච්ඡන්දික මිනුස්සු කොටසක් කියනවනේ. ඒගොල්ලන්ට ඒ තරම් ධර්මය අවබෝධ කරගන්න උවමනාවක් නෑ. ඒගොල්ලන්ට තියෙන්නේ ඒගොල්ලො ජීවත්වන අවුරුදු 1000 පිළිබඳ මාන්නයක්. කත්තු කම්‍යතා ඡන්දය ( පිං කිරීමේ කැමැත්තක් ) එහෙම නෑ. අන්න ඒවගේ අයටත් ධර්මය දේශනා කරාට අවබෝධ වෙන්නේ නෑ.

අනිත් එක තමයි **'ප්‍රඥාව'** නැති එක්කෙනාටත් ධර්මය අවබෝධ කරන්න බෑ. හේතුව ඵලය තේරුම් ගන්ට බැරි - කර්මය කර්ම විපාකය තේරුම් ගන්ට බැරි -ගැඹුරු ධර්මයක් - සියුම් ධර්මයක් - ස්කන්ධ ධර්ම - ආයතන එහෙම තේරුම් ගන්න බැරි - ප්‍රඥාව අඩු එක්කෙනාට කියනවා **'දුප්පඤ්ඤ'** පුද්ගලයා කියල. ඒ පුද්ගලයාටත් ධර්මය දේශනා කරත් ධර්මය ඇහුවත් තේරුම් ගන්න පුළුවන් කමක් නෑ. ධර්මය අවබෝධ වෙන්නේ නෑ.

සමහර වෙලාවට ඔය ධර්මය ගැන කථා කරනකොට මාර්ග ඵල ගැන කථා කරනකොට අපි බලන්න ඕනෑ ඒ කියන අය තුල මේ ආවරණ ධර්ම එහෙම පේන්න තියෙනවද කියල. අඩු පාඩු බැලීමක් වශයෙන් නෙමෙයි. ඒ මනුස්සයාව විවේචනය කරන්න - ඒ මනුස්සයාව පහත් කරන්න එහෙම නෙමෙයි. නමුත් ධර්මයක් බැලීම වශයෙන් අපි හිතන්න ඕන මා තුලත් - ඒ කථා කරන එක්කෙනා තුලත් මේ වගේ දේවල් විද්‍යාමාන වෙනවද කියල. එතකොට දැනගන්න පුළුවන්.

තවත් තියෙනවා ධර්ම කරුණු 6 ක් දැනගැනීමට. දිට්ඨි සම්පන්න පුද්ගලයා කියල කියන්නේ සම්මා දිට්ඨියෙන් සමන්නාගත වෙච්ච - දිට්ඨි සම්පන්න - සෝවාන් මාර්ග ඵල අවබෝධ කරගත්ත කෙනා. ඒ දිට්ඨි සම්පන්න පුද්ගලයාට උපදවා ගැනීමට **'නොහැකි'** කරුණු කීපයක් තියෙනවා. ඒ තමයි

1) **‘සක්කාය දිට්ඨිය’** - දිට්ඨි සම්පන්න පුද්ගලයාට සක්කාය දිට්ඨිය උපදවා ගන්න බෑ. උදාහරණයක්- දිට්ඨි සම්පන්න පුද්ගලයෙකුට, සෝවාන් වීමට පෙර පෘතක්ජනයෙකුව සිටි කාලයේදී “මට මෙහෙම හිතුන, ඒක කොහොමද? දැන් බලන්න ඕනේ උනේ” කියල ආපහු ගිහිල්ල එහෙම හිතන්න බෑ.

2) **‘විචිකිච්ඡාව’** - බුදුරජාණන්වහන්සේ ඉන්නවද නැත්ද - ධර්මය හරිද වැරදිද කියල සැකයක් ඇති කරගන්න බෑ.

3) **‘සීලබ්බත පරාමාසය’**

4) **‘අපායගමනීය රාග’** - දිට්ඨි සම්පන්න පුද්ගලයා තුලත් සාමාන්‍යයෙන් එක එක දේවල් වලට ලෝභය ඇතිවෙනවා - පුද්ගලයන්ට ලෝභ කරනවා වැනි රාග තියෙනවා හැබැයි අපායේ උපදින්න තරම් බලවත්වූ අපායේ ඉපදීමට හේතු භූත වූ රාග සිතුවිල්ලක් ඇති කරගන්න සෝවාන් මාර්ග ඵල ලාභියාට බෑ.

5) **‘අපායගමනීය දෝස’** - දිට්ඨි සම්පන්න පුද්ගලයා තුලත් සාමාන්‍යයෙන් පොඩි තරහක් ඇතිවීමට පුළුවන් නමුත් මහා බරපතල, මිනුස්සුන්ට ගහන්න බනින්න යන තරම් ද්වේශයක් ඇති කරගන්න බෑ.

6) **‘අපායගමනීය මෝහය’**

සෝවාන් මාර්ග ඵල අවබෝධ කරගත් තැනැත්තාගේ සිතේ ඉහත සඳහන් කරුණු 6 ඇති කරගන්න බෑ. මේක දැන ගන්න අවශ්‍ය වෙන හේතුව තමයි අද සමහර වෙලාවට තැන් තැන් වල සෝවාන් උනා කියනවා සකෘදාගාමී උනා කියනවා අනාගාමි උනාය කියල කියනවා හැබැයි මෙන්න මේ ඉහත සඳහන් කරුණු ඒ පුද්ගලයන්ගේ සිත් වල දර්ශනය වෙනවා. සමහරු කර්මය

කර්ම ඵලය පිළිගන්නේ නෑ. ඒ කියන්නේ විචිකිච්ඡාව තියෙනවා. සමහරුන්ගේ ලෝභකම හරියට තියෙනවා. අපායගාමී රාගය කියල කියන්නේ ඒකට. උදාහරණයක් හැටියට සාමාන්‍යයෙන් ඇඳුමකට පැලඳුමකට එහෙම කැමැත්තක් ආසාවක් තියෙනවා ලෝභ කිරීමක් තියෙනවා. තව තියෙනවනේ 'විසම ලෝභය' කියල එකක් - ඒ කියන්නේ තමන් ලෝභ කල යුතු නැති එහෙකට ලෝභ කිරීම. අපි හිතමු වෙනත් කෙනෙකුගේ ස්වාමියෙකුට - වෙනත් කෙනෙකුගේ භාර්යාවකට ලෝභ කරනවා. ආන්න ඒ ලෝභ කිරීම විසම ලෝභයක්. තමන්ට අයිති නැති ඉඩමකට - තමන්ට අයිති නැති වාහනේකට - තමන්ට අයිති නැති ව්‍යාපාරයකට හොරකම් කරගන්න ලෝභ කරනවා.

**මම මේ කියන දෙයින් ආර්යන් වහන්සේලාට අගෞරවයක් නොවේවා!**

මම අහල තියෙනවා එක අනාගාමී කියල කියන මාර්ග ඵල අවබෝධ කරගත්තා කියල කියන කෙනෙක් ලංකාවට ගිහිල්ල හොරෙන් ඉඩමක් ලියා ගත්ත කියල. ඒකෙ නඩු දැන්. ඔය වගේ දේවල් තියෙනවා. ඒවා ඇවිල්ල අපායගාමිනී රාගය. අනුන්ගේ දේවල් කඩා වඩා ගන්නව කියන ඒවා ශිෂ්ට සම්පන්න ලෝකේ එහෙම කරන්නේ නෑනේ. **'ආර්ය'** කියන එකේ තේරුම - **'බුදු' 'පසේ බුදු' 'මහරහතන් වහන්සේලා'** කියන එක සහ - **'පරම නිවැරදියි'** කියන එක. එතකොට ආර්ය ධර්මයක් ප්‍රත්‍යක්ෂ කරගත්තාවූ ඒ ආර්ය උත්තමයා කවදාකවත් එහෙම කරන්නේ නෑ.

තව තියෙනවා විශාඛාවගේ සිද්ධියක් මෙහෙම. විශාඛාව බොහෝ ධනය තිබෙන සිටු පවුලක කෙනෙක්. දවසක් විශාඛාව රජගහනුවර ඉඳල සැවැත්නුවරට විශාල ප්‍රමාණයක් බඩු ගෙන්න ගත්ත. ඒ බඩු තමන්ගේ රටට ගෙන්වා ගැනීමේදී අයකරන බදු මුදල සාමාන්‍ය ප්‍රමාණයට වඩා වැඩියෙන් විශාඛාවගෙන් අය කරන්න කියල කොසොල් රජ්ජුරුවෝ සේවකයන්ට උපදෙස් දීල තිබුන. බලාගෙන යනකොට ඒක හරි අසාධාරණ අය කිරීමක් නිසා එහෙම කරන්න එපා කියල කියන්න විශාඛාව කීප වතාවක්ම කොසොල් රජ්ජුරුවන්ගේ මාළිගාවට ගියා. හැම අවස්ථාවකම කොසොල් රජ්ජුරුවෝ විශාඛාව එනකොට හැංගෙනවා. විශාඛාව ඉඳල ඉඳල ආපහු එනවා. ඒ රජ්ජුරුවෝ මුණ ගැහීමට ගිය ගමන කිසි දවසක සාර්ථක උනේ නෑ. දවසක්

ඉඳල ඉඳල වෙහෙසට පත් වෙච්ච විසාඛාව කල්පනා කරා මේ ආපු ගමනේ බුදුරජාණන්වහන්සේවත් බලාගෙන ගියොත් හොඳයි කියල දවල් වරුවෙම විහාරයට ගියා. එතකොට බුදුරජාණන්වහන්සේ අහනවා “මේ අවේලාවේ කොහේ යන ගමන්ද” කියල. පස්සේ විසාඛාව බුදුරජාණන්වහන්සේට සැලකළා රජ්ජුරුවෝ වැඩියෙන් අය කරපු දඩ මුදල අඩු කරන්න කියල කියන්න කීප වාරයක්ම ගිය බවත් රජ්ජුරුවෝ ඒකට ඉඩ දෙන්නේ නැති බවත්. සෝවාන් උපාසිකාවක් වූ විශාඛාව එතැනදී ඒ කථා කරේ සධාරණේට, හොර බොරුවකට නෙමෙයි. ඒක අනුන්ගේ දෙයක් නෙමෙයි. තමන්ගේ දේ වෙනුවෙන් කථා කිරීමක්. එහෙම කරන්න පුළුවන්.

එතකොට **‘අපායගාමිනී රාගය’** කියල කියන්නේ තමන්ට අයිති නැති දේවල්වලට ලෝභය උපදවනවා - රාගය උපදවනවා කියන එකයි.

ඊළඟට **‘අපාය ගාමිනී දෝසය’** කියන්නේ මහා සාවද්‍ය විදියට ද්වේශ සහගත සිත් හදාගන්නවා **‘ඒ සඳහා මෝහය උපදවා ගන්නවා’.** මේ කරුණු 6 සෝවාන් ආර්ය පුද්ගලයෙක් ළඟ - දිට්ඨි සහගත පුද්ගලයෙක් ලඟ පිහිටන්නේ නෑ.

අනිත් එක තමයි බුදුරජාණන්වහන්සේ දේශනා කරපු ඒ ධර්මය නොමිලේම දෙසූ ධර්මයක්නේ. බුදුරජාණන්වහන්සේ නොමිලේම පරම කරුණාවෙන් පයින්ම වැඩම කරමින් සත්වයන්ගේ විමුක්තිය පිණිස දේශනා කරපු ඒ ධර්මය භාවිතා කරමින් සමහරු එක්කෙනෙක් සෝවාන් කරන්න 25,000 ක් අය කරනවා. ඒක අයිතිවෙන්නේ අපායගාමිනී රාගයට. බුදුරජාණන්වහන්සේ මහා කරුණාවෙන් දේශනා කරපු ඒ ධර්මය කිසිම පිරිකරක් - ලාභයක් - ලෝභයක් - උපස්ථානයක් බලාපොරොත්තු වෙන්නේ නැතුව දේශනා කරන්න කියල තමයි බුදුරජාණන්වහන්සේ දේශනා කරලා තියෙන්නේ. දෙන නොදෙන එක මිනුස්සුන්ගේ වැඩක්. හැබැයි charge කරන්න බෑ. අපායගාමීය රාගය කියල කියන්නේ ඒකට සමාන දෙයක්. කඩදාවත් සෝවාන් ආර්යන් වහන්සේලා සල්ලි වලට බණ කියන්නනේ නැහැ. ඒකනිසා මේ ධර්මය දැනගන්න ඕන. මේ ධර්මය දැන් ගත්තයින් පස්සේ තමයි ඒ කියනදේ - ඒ කියන පුද්ගලයාව අපිට ධර්මයෙන් මනින්න පුළුවන්. ධර්මයෙන් විතරනේ කෙනෙක් මනින්න කිරන්න පුළුවන්. එතකොට අපි

රැවටෙන්නේ නෑ කවදාවත්.  අන්න ඒකටයි මේවා කියන්නේ. දැන් සමහරු ගොඩක් සල්ලි දීල සොවාන් වෙලා ඉන්නවා. සමහරුන්ට මම හිතන්නේ certificates හිටන් හම්බ වෙලා තියෙනවා. අවංකවම කියනවානම් කෙනෙක් සසර දුකෙන් මිදිලා - සක්කාය දිට්ඨිය විචිකිච්ඡාව නැති කරගෙන - මේ අපාය ගමනින් විනිර්මුක්තවෙලා - අපාය දුක නසාගෙන - සතර අපායේ උපදින්නේ නැතුව - ආර්ය භාවයට පත්වෙනවා කියන එක සාධු කාර දීල පිළිගන්න ඕනෑ එකක්.  ඒක හැබැව, අපිත් කැමතියි ඒකට. කවුරුහරි සසර දුකෙන් මිදිලා සතර අපායෙන් මිදිලා යනව නම් අපි කැමතියි. හැබැයි මිනිස්සු සසර දුකෙන් සතර අපායෙන් මුදවනවා කියල සල්ලි ගන්න හොඳ නෑ. දැන් විශාඛාවගෙන්වත්  වෙන කිසිම කෙනෙකුගෙන්වත්  සල්ලි ඉල්ලුවේ නෑනේ බුදුරජාණන්වහන්සේ හෝ වෙන කිසිම භික්ෂූන්වහන්සේ නමක්.  එතකොට වෙන්නේ මොකක්ද? ආර්යන්වහන්සේලාගේ ධර්මය ලෝකයට විකුණන වැඩේ කරනවා. දිට්ඨි සම්පන්න පුද්ගලයා මේ දේවල් කවදාවත් කරන්නේ නෑ.

දිට්ඨි සම්පන්න පුද්ගලයෙක් ළඟ තිබෙන තවත් කරුණු ටිකක් තියෙනවා. මේ පින්වතුන්ට මේව කියල දෙන්නේ මේවා  තේරුම් ගන්නයි. ඉස්සෙල්ල කිව්වේ දිට්ඨි සම්පන්න පුද්ගලයෙක් බවට පත් වීමට නොහැකි දිට්ඨි සම්පන්න පුද්ගලයෙන් ළඟ තිබිය නොහැකි ආවරණීය ධර්ම 6ක්.

## <u>අභව්‍ය ධම්ම</u>

1) **'අභබ්බො දිට්ඨිසම්පන්නො පුග්ගලො සත්ථරි අගාරවො විහරිතුං අප්පතිස්සො'** = දිට්ඨි සම්පන්න වූ සෝවාන් පුද්ගලයෙක් - බුදුරජාණන්වහන්සේගේ  ධර්මයෙහි අචලව  පිහිටියාවූ කෙනෙක් කවමදාකවත්ම බුදුරජාණන්වහන්සේ කෙරෙහි අගෞරවයෙන් පිළිගැනීමක් නැතුව නොසළකා ඉන්නේ නෑ.

2) **'අභබ්බො දිට්ඨිසම්පන්නො පුග්ගලො ධම්මෙ අගාරවො විහරිතුං අප්පතිස්සො'** = දිට්ඨි සම්පන්න වූ සෝවාන් පුද්ගලයෙක් ධර්මයට අගෞරව වෙන විදියට ධර්මය පහත් කරලා අධර්මානුකූලව පවතින්නෙත් නෑ.

3) **'අභබ්බො දිට්ඨිසම්පන්නො පුග්ගලො සඞ්ඝෙ අගාරවො විහරිතුං අප්පතිස්සො'** = දිට්ඨි සම්පන්න වූ සෝවාන් පුද්ගලයෙක් සංඝ රත්නය කෙරෙහි නොසලකා සංඝ රත්නයට  අගෞරවවෙන විදියට සංඝරත්නය පහත් වෙන විදියට කවදාකවත්ම කටයුතු කරන්නේ නෑ.

4) **'අභබ්බො දිට්ඨිසම්පන්නො පුග්ගලො සික්ඛාය අගාරවො විහරිතුං අප්පතිස්සො'** =  දිට්ඨි සම්පන්න වූ සෝවාන් පුද්ගලයෙක් තමන් සමාදන් වූ සීලය නොසලකා සීලයට ගෞරවයක් නැතුව කටයුතු කරන්නේ නෑ. කවදාකවත් මත් පැන් බොන්නේ නෑ.

අදහසක්  - ස්වාමීන් වහන්ස සරකානි කලුරියකරනකම්ම මත්පැන් බිව්වා කියල බණක් ඇහුව

ස්වාමීන්වහන්සේ - නෑ, ඒ කථාව මේ ධර්මයට  ගැලපෙන්නේ නෑ. සරකානි හෝ වේවා වෙනත් කෙනෙක් හෝ වේවා දිට්ඨි සම්පන්න පුද්ගලයෙක් උනාට පස්සේ එයා සමාදන් වූ පංච සීලයට කියන්නේ **'අරියකාන්ත සීලය'** කියල. ආර්ය  භාවයට පත් උනාට පස්සේ එම සීලය ධර්මයක් හැටියට පිහිටනවා, සමාදන් උනේ නැතත්. එහෙම කෙනා කවදාකවත්ම ඒ සීලය කඩන්නේ නෑ. මෙතන තියෙන්නේ **'අභබ්බො දිට්ඨිසම්පන්නො පුග්ගලො සික්ඛාය අගාරවො විහරිතුං අප්පතිස්සො'** = බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා දිට්ඨි සම්පන්න පුද්ගලයා කිසිම දවසක තමන්ගේ ශික්ෂා වලට ගෞරවයක් නැතුව සීලයට ගෞරවයක් නැතුව ජීවත් වෙනවා - පිහිටනවා - පවත්වනවා කියන එක සිද්ධ වෙන්න බැරි දෙයක් කියල. **'අභබ්බො'** කියල කියන්නේ **'සිද්ධ වෙන්න බෑ'** කියන එකයි. එතකොට මේ දේශනාවල් කරන්නේ ලොව්තුරා බුදුරජාණන්වහන්සේ. අපි ධර්මය දෙස  බලන්නේ ලොව්තුරා බුදුරජාණන්වහන්සේ දේශනා කල ධර්මයට ගැලපෙන්නයි. අනිත් අය කියන ඒවා නෙමෙයි.

ඊළඟට තියෙනවා සරකානිගේ ප්‍රශ්නය. සරකානි සූත්‍රය හැම එක්කෙනාම කියවන්න. එතකොට තේරේවි. මම හිතන්නේ ඉස්සෙල්ල අවස්ථාවක සරකානි ගැන මම මතක් කරා. සරකානි මොන වංශිකයෙක්ද? එයා ශාක්‍ය වංශිකයෙක්. එයා ඒ කාලේ මත්පැන් පානය කරලා තියෙනවා. ශාක්‍යවරු පිළිඅරන් තියෙන්නේ එයා මත්පැන් බොන්නාවූ කෙනෙක් හැටියටයි. ඉතිං සරකානි අන්තරා උනා. අන්තරා උනාට පස්සේ ඒ බව ශාක්‍යවරුන් සහ භික්ෂූන් වහන්සේලා බුදුරජාණන්වහන්සේට ඇවිල්ල කියනවා. ඒ වෙලාවේදී බුදුරජාණන්වහන්සේ ප්‍රකාශනයක් කරනවා. ඒ ප්‍රකාශනය තමයි “සරකානි කියන්නේ බොහොම හොඳ ශ්‍රද්ධාවන්ත බොහොම ගුණවත් කෙනෙක්. ඔහු දිට්ඨි සම්පන්න පුද්ගලයෙක් වෙලා සෝවාන් මාර්ගඵල අවබෝධ කරගෙන සුගතියේ උපන්නා” කියන කතාව. ඔච්චරයි කියන්නේ බුදුරජාණන්වහන්සේ - අර බීපු කථා ඒවා මොකවත් බුදුරජාණන්වහන්සේ කියන්න යන්නේ නෑ. සරකානිගේ හිතේ තිබ්ච්ච ස්වභාවය පමණක් බුදුරජාණන්වහන්සේ මතක් කරනවා. බුදුරජාණන්වහන්සේ, සරකානි සෝවාන් වෙලා කියල කියපු එක අනිත් ශාක්‍යයන්ට ආරංචි උනා. ඉතින් ඒ වෙනකොට බොහෝ ශාක්‍යවරු මත්පැන් පානය කරනවා. වෙනත් අයත් මත්පැන් පානය කරනවා. ශාක්‍යවරු කියන්න පටන් ගත්ත ‘සරකානිටත් සෝවාන් වෙන්න පුළුවන් උනා නම් කවුරුත් සෝවාන් නොවේද’ කියල. ඒවෙලාවේදී මහානාම ශාක්‍යතුමා ඇවිල්ල බුදුරජාණන්වහන්සේට කියනවා මෙහෙම ‘බුදුරජාණන්වහන්සේ සරකානි සෝවාන් උනා කියල සඳහනක් කරලා තියෙනවා - ඒක ආරංචි වෙලා ශාක්‍යවරු කියනවා ඔච්චර බීපු මනුස්සයකුටත් සෝවාන් වෙන්න පුළුවන් උනානම් අනිත් අයටත් හරි පහසුයිනේ සෝවාන් වෙන්න, එහෙමනම් සෝවාන් උන අයගෙන් හිස් වෙන්න බැහැනේ කියල කියනවා’ කියල. ඒ වෙලාවේ බුදුරජාණන්වහන්සේ ධර්ම කාරණයක් දේශනා කරනවා. එයා ඉස්සර වෙලා මත්පැන් පානය කරන්න පුළුවන් හැබැයි, සරකානි ශාක්‍යයා සෝවාන් වෙච්ච වෙලාව කියන්නේ නෑනේ.

දැන් අර සන්තති අමාත්‍යවරයා ඉන්නවනේ. එයත් බීලානේ ගියේ. සන්තති අමාත්‍යවරයා නළගනක් මැරිලා වැටුන වෙලාවේ බුදුරජාණන්වහන්සේ ළඟට ගියානේ දුක නැති කරගන්න. බුදුරජාණන්වහන්සේ ධර්මය දේශනා කරා. ඒ වෙලාවේදී සන්තති අමාත්‍යවරයා මාර්ග ඵල අවබෝධ කරගන්න කොට alcohol ඇඟේ. හැබැයි ඊට පස්සේ ඩිංගක් බීලා පිරිනිවන්පෑව කියල නෑනේ.

ඒකනිසා ඉස්සරවෙලා එහෙම වෙන්න පුළුවන්. හැබැයි ආර්ය ධර්මයෙහි පිහිටියට පස්සේ ඒ වැරදි වැඩේ කරන්නේ නෑ. ඒකයි ඒ කියන්නේ.

5) **'අභබ්බො දිට්ඨිසම්පන්නො පුග්ගලො අනාගමනීයං වත්ථුං පච්චාගන්තුං'** = දිට්ඨි සම්පන්න වූ සෝවාන් පුද්ගලයෙක් දෙසැටක් මිත්‍යාදෘෂ්ඨි කරුණු ආදී තමන්ගේ ජීවිතයෙන් අයින්කරපු දේවල් නැවත කවදාකවත්ම ඇති කරන්නේ නැහැ.

6) **'අභබ්බො දිට්ඨිසම්පන්නො පුග්ගලො අට්ඨමං භවං නිබ්බත්තෙතුං'** = දිට්ඨි සම්පන්න වූ සෝවාන් පුද්ගලයෙක් අටවන භවයක උපත්තියක් නොගනී. උදාහරණයක් ලෙස කීවොත් සෝවාන් වූ පුද්ගලයෙක් 7 වන භවයේදී මනුස්සලෝකේ ඉපදිලා, එහිදී ඔහුට ආරංචි වෙනවා මෛත්‍රී බෝසතාණවහන්සේ තුසිත දිව්‍යලෝකේ වැඩ සිටින බවත් එහි ගියොත් ධර්මය අහගන්න පුළුවන් බවත්. මෙයාට තුසිත දිව්‍යලෝකෙට යා යුතුයි කියලා සිතුවිල්ලක් පහළ උනත් සෝවාන් ආර්යන් වහන්සේ කෙනෙක් නිසා තව ආත්මයකට ජීවිතිය extent කරන්න බෑ. කවදාකවත් 8 වෙනි ආත්මභාවයක උපදිනවා කියන එක සෝවාන් ආර්ය පුද්ගලයෙකුට සිදු නොවෙන දෙයක්.

මේ ඉහත සඳහන් කරුණු 6 දිට්ඨිසම්පන්න සෝවාන් පුද්ගලයෙකුට කවරදාකවත්ම සිදු නොවෙන (අභව්‍ය) කරුණු. අපි මේවා දැනගෙන තියෙන්න ඕනෑ. මේවා හොඳට කියවන්න ඕනෑ. ගෞරවණීය ස්වාමීන්වහන්සේලාගෙන් අහන්න ඕනේ. කියවල - බණ අහල - ගෞරවණීය ස්වාමීන්වහන්සේලාගෙන් ඒවා පිළිබඳ දැනගෙන සෝවාන් දිට්ඨි සම්පන්න පුද්ගලයෙක් යනු කවුද - ඒ පුද්ගලයා තුල තිබෙන්නාවූ ගුණ මොනවාද - ඒ පුද්ගලයාගෙන් වෙන්න පුළුවන් ඒවා මොනවාද - වෙන්න බැරි දේවල් මොනවද කියල හොඳට දැනගෙන තියෙන්න ඕන. එතකොට කවදාකවත්ම සිල්ලර කාසි වලට සෝවාන් වෙන්න යන්නේ නෑ කවුරුවත්. මෙහෙම එකක් තියෙනවා කාට හරි පරිත්‍යාගයක් කරන්න ඕනේ නම් ඒක දුන්නට කමක් නෑ. යම්කිසි සේනාසනයකට -ආරණ්‍යයකට - ලෙඩෙකුට - ස්වාමීන්වහන්සේ කෙනෙකුට හෝ ගිලන් කෙනෙකුට දුර වශයෙන් හෝ ළඟ වශයෙන් තමන් හම්බ කරගත්ත දේ මුදල් වලින් හෝ භාණ්ඩ වශයෙන් හෝ ඇඳුම් පැලඳුම් හෝ දුන්නට ඒකෙ කිසිම ප්‍රශ්නයක් නෑ. ඒක දාන පාරමිතාවට හොඳයි.

හැබැයි සෝවාන් වෙන්න කියල ගිහිල්ල හොරුන්ට සල්ලි දෙන්නනම් එපා. ඒක තමයි කියන්න තියෙන්නේ. මටත් එපා, ඒකත් කියන්න ඕනේ.

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස ආර්ය භාවනා හෝ ආර්ය දැහැන් කියල භවනා ක්‍රමයක් තියෙනවද?

<u>පිළිතුර</u> - ඒ නමින්ම නෑ. ආර්ය අශ්ඨාංගික මාර්ගයට අයිති ඕනෑම එකක් ආර්ය භවනා කියන්න පුළුවන්. නමුත් ආර්යන් වහන්සේලත් ඒවා ආර්ය භාවනා ආර්ය ධ්‍යාන කියල එහෙම නම් කරලා නෑ. එහෙම නමුත් විමුක්තියට හේතුවෙන දේවල් ඔක්කොම ආර්ය කියල ගන්න පුළුවන්.

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස සෝවාන් මාර්ග ගාමිනී තැනැත්තා සහ සෝවාන් මාර්ගස්ථ පුද්ගලයාගේ වෙනසක් තියෙනවද?

<u>පිළිතුර</u> - ඔව්, දැන් අපිත් මාර්ගය වඩාගෙනනේ යන්නේ. විශේෂයෙන්ම සෝවාන් මාර්ගයේ යන එක්කෙනා කියල කියන්නේ උදයව්‍ය ඥානය එහෙම වඩාගෙන සංස්කාර ධර්මයන් ගැඹුරින් දකින්නාවූ එතනිනුත් එහාට හිත වැඩූ පුද්ගලයා තමයි සෝවාන් මාර්ගයේ ගමන් කරනවා කියල කියන්න පුළුවන්. තමනුත් ප්‍රාථමික මට්ටමින් ඒ පැත්තට ගමන් කරනවා කියල හිතා ගන්න පුළුවන්.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස මාර්ගස්ථ වීම කියන එකේදී වෙන වෙනස මොකක්ද? දැන් ‘මාර්ග ලාභියා’ ‘ඵල ලාභියා’ කියල දෙකක් තියෙනවනේ

<u>පිළිතුර</u> - මාර්ගස්ථ කියල කියන්නේ - ‘ථ’ කියල කියන්නේ මාර්ගය අනුගමනය කරමින් ඉන්නකෙනා කියන එකයි. තවම චතුරාර්ය සත්‍ය ධර්මයන් නිවන් අවබෝධ කරන තත්වයට වඩලා නෑ නමුත් ඒ මාර්ගයේ ඉන්නවා කියන එකයි.

<u>ප්‍රශ්නය</u> - මාර්ගය අවබෝධ කරා කියන්නේ?

<u>පිළිතුර</u> - මාර්ගයේ අවබෝධ කරන්න දෙයක් නෑ. මාර්ගය තියෙන්නේ අනුගමනය කරන්න.

<u>ප්‍රශ්නය</u> - එතකොට ස්වාමීන්වහන්ස අභිධර්මයේ කියනවනේ මාර්ග චිත්තය පහළ උන ගමන්ම ඵල චිත්තය පහළ වෙනවා කියල.

<u>පිළිතුර</u> - ඔව්, මාර්ග චිත්තයට අවබෝධ වෙන්නේ මොකක්ද? ඵල චිත්තයට අවබෝධ වෙන්නේ මොකක්ද?

එතැන තියෙන අවස්ථාව පොඩ්ඩක් පැහැදිලි කරලා දෙන්න ස්වාමීන්වහන්ස

<u>ස්වාමීන්වහන්සේ</u> - ඒ අවස්ථා දෙක ළඟ දුර වශයෙන් නෙමෙයි හැබැයි මට ඒ ගැන මෙන්න මෙහෙම කියන්න පුළුවන්. මාර්ග හිතක් තියෙනවනේ - ඒ මාර්ග සිතට අරමුණක් තියෙනව. හැම හිතකටම අරමුණක් තියෙනවා. ලෝභ - ද්වේෂ - කාමාවචර කුසල් - ඇරූපා වචර - රූපා වචර ආදී හැම සිතකටම අරමුණක් තියෙනවා. මාර්ග සිත කියන එකටත් අරමුණක් තිබෙනවා. මාර්ග සිතට වෙන දෙයක් සිතන්නටවත් මොකක්වත් කරන්න බෑ. මේ මාර්ග සිතට සංස්කාර ධර්මයෝ අනිත්‍යයයි - දුකයි කියල මෙනෙහි කරන්න බෑ. සංස්කාරයන් බලන්න බෑ මේ මාර්ග සිතට - අරමුණු වෙන්නේ නෑ. මාර්ග සිතට පුළුවන් කම තියෙන්නේ නිර්වාණය දැකීමට විතරයි. පළමුවෙන වතාවට නිර්වාණය ස්පර්ශ කරන හිතට කියනවා මාර්ග සිත කියල. කවදාකවත් මේ මාර්ග හිතට සංස්කාරයක් අනිත්‍ය විදියට පේන්නෙත් නෑ - දුක හැටියට පේන්නෙත් නෑ - අනාත්ම හැටියට පේන්නෙත් නෑ.

අනිත් එක, මේ ‘මාර්ග සිතට’ කලින් පහළ වෙනවා ‘අනුලෝම’ සහ ‘ගෝත්‍ර භූ’ යනුවෙන් සිත් දෙකක්. ඒ දෙකටත් යම්කිසි ප්‍රමාණයකට නිවන වැටහෙනවා නමුත් මාර්ග සිතට තරම් ගැම්මක් නෑ. ඒ සිත් දෙක විපස්සනා සිත් දෙකක්. අනුලෝම හිතට නිවන පෙන්නේ නෑ. විපස්සනා කිරීමේදී ඉතාම උසස් ලෙස පැහැදිලිව විපස්සනාව (bright) ඇතිවෙන්නේ මේ අනුලෝම සිතේ. මේ අනුලෝම ඥානය ඇති උනාට පස්සේ ගෝත්‍ර භූ සිත පහළ වෙනවා. ඊට පස්සේ මාර්ග සිත පහළ වෙනවා. ඊට පස්සේ තමයි ඵලසිත පහළ වන්නේ. ඵල සිතට අරමුණු වෙන්නේ නිවන. මාර්ග අවස්ථාවේදී හොඳටම විපස්සනාව

වැඩීම ආදිය සිද්ද වෙන්නේ අනුලෝම සිතේ. සංස්කාරයන් අරමුණු කරන තැන තමයි ඒ අනුලෝම සිත. හැබැයි, මාර්ග සිත ඒ නමින් හඳුන්වන්නේ අනුලෝම ඥානයේ ප්‍රතිඵලයක් හැටියට මාර්ග සිතට නිවන අරමුණු වෙන නිසා. මාර්ග සිත කියන්නේ එක මොහතක සිදුවීමක්. මාර්ග සිත ඇති උනාට පස්සේ ඵල සිත පහළ වෙනවාමයි. 'දස්සනේන සම්පන්නො' කියල කියන්නේ මාර්ග ඵල අවබෝධ කරගත්ත කෙනාට. සම්මා දෘෂ්ඨියෙන් සමන්නාගත එක්කෙනාටයි, දිට්ඨි සම්මපන්න පුද්ගලයා - සෝවාන් පුද්ගලයා කියල කියන්නේ. අභිධර්ම විස්තරයට අනුකූලව මාර්ග සිත සහ ඵල සිත අතර දිග gap එකක් තියල කථා කරලා නෑ.

<u>විමසීමක්</u> - අෂ්ඨාර්ය පුද්ගල වශයෙන් වෙන් කරලා දක්වන්න පුලුවන්ද?

<u>ස්වාමීන්වහන්සේ</u> - අෂ්ඨාර්ය පුද්ගලයන් හැටියට වෙන්කරලා දක්වන්න පුළුවන් මෙහෙම - එක අවස්ථාවක බුදුරජාණන්වහන්සේ ඉදිරිපිට නිශ්ශබ්දව භාවනා යෝගීව වැඩ සිටියාවූ භික්ෂුන් වහන්සේලා පිරිසක් අරභයා දේශනා කරලා තියෙනවා මෙහෙම - "මේ ඉන්න පිරිසේ සති පට්ඨානය වඩන අය ඉන්නවා. මේ ඉන්න පිරිසේ ඉන්ද්‍රිය වඩන අය ඉන්නවා. මේ ඉන්න පිරිසේ බොජ්ඣංග වඩන අය ඉන්නවා. මේ ඉන්න පිරිසේ මාර්ගය වඩන අය ඉන්නවා. මේ ඉන්න පිරිසේ ඉර්ධිපාද වඩන අය ඉන්නවා. මේ ඉන්න පිරිසේ වීර්ය වඩන අය ඉන්නවා" කියල මේ ඉන්න භික්ෂුන් වහන්සේලා ගැන වෙන වෙනම - මේ මේ ධර්ම වඩන අය ඉන්නවා කියල දේශනා කරනවා. ඒ අය කොහොමද ඇත්තටම තේරුම් ගන්නේ? ඔක්කොම අය එකක් කරොත් ඕවා ඔක්කොම වැඩෙන්නේ නැත්ද? සමහර ස්වාමීන්වහන්සේලා තදබල ලෙස සමාධි ගතවෙලා බොජ්ඣංග ධර්මයන්ට ගැලපෙන මට්ටමක හිත පවත්වාගෙන හිටිය. ඒ අය අරමුණු කරගෙන බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා බොජ්ඣංග වඩන අය මෙතන ඉන්නවා කියල. සමහර ස්වාමීන්වහන්සේලා වීර්ය ධර්ම හතර කුසල වශයෙන් සහ අකුසල වශයෙන් අකුසල වීර්ය තුරන් කරමින් කුසල ආරම්මණයක හිත යොදාගෙන වීර්ය වඩමින් ඉන්නවා. ඒක අරමුණු කරමින් බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා මෙතැන වීර්ය වඩන අය ඉන්නවා කියල. ඉර්ධිපාද වඩන සමහර අය ඡන්දය මුල් කරගෙන භාවනාව වඩනවා. සමහර අය ප්‍රඥාව මුල් කරගෙන භාවනා වඩනවා. සමහර අය චිත්තය, අදිශ්ඨානය මුල් කරගෙන මෙහෙම කල යුතුයි කියල භවනා කරනවා. ඒ අය අරමුණු කරගෙන බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා මේ අය අතර සතර ඉර්ධිපාද වඩන අය ඉන්නවා කියල. සත්තිස්බෝධිපාක්ෂික ධර්ම වඩන භිෂුන්වහන්සේලා එතන සියයක් හිටියොත් ඒ හිත් වැඩ කරන්නේ සිය ආකාරයකටනේ. එතකොට ඒ සිත්වල

කෙලස් ඇතිවෙන කොට ඒ කෙලෙස් නැති කරන්න ඒ භික්ෂුන්වහන්සේලා මහන්සි ගන්නවා. සමහර කෙනෙකුට සමාධිය තිබෙනවා ඒ සමාධියේ සිත රඳවගෙන ඒ භික්ෂුන්වහන්සේ වැඩ කරගෙන යනවා. සමහර කෙනෙකුට හොඳට ප්‍රඥාව තියෙනවා. ඒ භික්ෂුන්වහන්සේලා විදර්ශනා වඩමින් යනවා. ඒ ඔක්කොම ටික බුදුරජාණන්වහන්සේ දැකල ඒ සියලුම ස්වාමීන්වහන්සේලාගේ සිත්ටික categorise කරලා දේශනාව කරනවා. ඒවගේ ගත්තම මේ අභිධර්ම ක්‍රමයේ දීර්ඝ කාලින වශයෙන් අවස්ථා දෙකක් දක්වන්නේ නෑ. මාර්ග සිත ඇති වෙච්ච ගමන්ම ඊට අනතුරුව ඵල සිත පහළ වෙනවා. ඵල සිත පහළ උනාට පස්සේ ඵල සමාපත්තියක් තියෙනවානේ. ඒකෙ ඉන්නේ නැතුව එයා සකෘදාගාමී වෙන්න නැවත විපස්සනා කරනවා. විපස්සනා කරනකොට එයා සකෘදාගාමී මාර්ගයට බැස ගත්ත කෙනෙක් වෙනවා.

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස ගෝත්‍රභූ කියන වචනේ තේරුම මොකක්ද?

<u>සවාමීන්වහන්සේ</u> - ගෝත්‍රභූ කියල කියන්නේ පහළ තලයෙන් උඩ තලයට නගින්නාවූ කියන එකයි.

තවත් එක්ක තියෙනවා - සෝවාන් මාර්ග ඵල අවබෝධ කරගත්ත කෙනෙක් කවදාකවත් කෝතුහල මංගලිකයෝ වෙන්නේ නෑ. කෝතුහල මංගලිකයෝ වෙන්නේ නෑ කියන්නේ උදේට පැන් කළයක් දැක්කහම දවස සුභ වෙනවා ආදී දිට්ඨ සුත මුත වශයෙන් සාමාන්‍ය මිනුස්සුන් පිළිගන්න නිමිති සෝවාන් ආර්ය ශ්‍රාවකයා පිළිගන්නේ නෑ කියන එක. සෝවාන් වෙලා කියල කියන කෙනෙක්ව (සෝවාන් මාර්ග ඵල වලට අගෞරව කරන්නේ නැතුව) දැනගැනීම සඳහා පරීක්ෂණ කරන්න පුළුවන්.

අර ඉස්සර රජකෙනෙක් එහෙම එහෙම කරා කියල තියෙනවනේ. ඒ රජ්ජුරුවෝ රහතන් වහන්සේකෙනෙක් වශයෙන් පෙනී හිටිය භික්ෂුන් වහන්සේ ඉදිරියේදී දෙහි ගෙඩියක් කපල හැපුවලු. එතකොට ඒ රහතන්වහන්සේයයි කියන භික්ෂුන්වහන්සේගේ කට ඇදවෙනවා. ඒකෙන් තමයි දැනගෙන තියන්නේ ඒ භික්ෂුන්වහන්සේ රහතන්වහන්සේ කෙනෙක් නොවෙන බව. එහෙම දේවල් කරල තිබෙනවා. තවත් අවස්ථාවක ඉර්ධි තිබෙනවා කියල කියපු භික්ෂුන් වහන්සේ නමක් වැඩ ඉඳල තියෙනවා.

සේනාසනය තිබිල තියෙන්නේ කන්දක් උඩ. දායක මහත්තය දානයට වඩම්මගෙන යන්න රවුමට රවුමට කන්ද වටේ තියෙන පාර දිගේ ඇවිල්ල ආරාධනා කරහම 'උපාසක මහත්තය යන්න මම එන්නම්' කියල ඒ සේනාසනය පිටිපස්සේ තියෙන නුග ගහක තියෙන වැලක එල්ලිලා පහළට බැහැල දායක මහත්තයටත් කලින් යනවා. දායක මහත්තයට පුදුම හිතිලා ගිහිල්ල අහනවා. එතකොට මේ භික්ෂුන්වහන්සේ ඉර්ධි ඇතිබව හැඟවෙන විදියට ප්‍රකාශයක් කරනවා. මේ විදියට කීප දවසක්ම කරනවා. ඊට පස්සේ දායක මහත්තයට දවසක හිතුන මේ ගැන පරික්ෂා කරන්න ඕනේ කියල. මෙහෙම පරික්ෂා කරලා දැනගෙන දවසක් ඒ භික්ෂුන් වහන්සේ එල්ලිලා පහළට බහින්න උපකාර කරගත්තු ඒ නුග වැල බාගෙට කපල තිබ්බා. වෙනදා මෙන් එදත් ඒ වැලේ එල්ලිච්ච හාමුදුරුවෝ බිමට වැටුන. මිනිස්සු ඔහොම දේවල් කරලා තියෙනවා. ඕව අද විතරක් නෙමෙයි බුදුරජාණන්වහන්සේගේ කාලෙත් කරා. ඇත්ත වශයෙන්ම මුලා වෙන එක නවත්ත ගන්න බුද්ධියෙන් ඥානයෙන් පරික්ෂා කරලා දැන ගන්න කරපු වැඩ මේවා.


සමහර ඒවා තියෙනව හිංසාකාරී වගේ පේනවා. එක්කෙනෙක් බුදුරජාණන්වහන්සේට ආරාධනා කරා දානයට. ඊට කලින්, ඉර්ධි බල - ප්‍රාතිහාර්ය - දුර පේන්නාවූ නුවණ - ඊළඟ ආත්ම පේන නුවණ - පෙර ආත්ම ආදී දේ පේන ශක්තිය තිබෙනවා කියල කියන නිගණ්ඨයෝ ටිකකට ඒ ගොල්ලෝ දානයකට ආරධනා කරා. ඉතිං කොටසක් කියනවා 'අපි නිගණ්ඨ සාධූ වරු - පෙර ආත්ම බලන්න පුළුවන් - අනාගතය බලන්න පුළුවන් - දිව්‍යලෝක බලන්න පුළුවන් - ගව්ගානක් සිද්ධ වෙනදේ බලන්න පුළුවන් ශක්තිය තියෙන අය' කියල. එහෙම ශක්තිය තිබෙන කීප දෙනෙකුට හොඳට කෑම බිම හදල කට්ටියක් ආරාධනාවක් කරා. ඒ ගෙදර ආසන පනවල තියෙන තැනට ඉස්සරහෙන් මීටරයක් විතර ගැඹුරට ඇලක් වගේ කාණුවක් කපලා ඒක උඩින් වැහුවා. වහල, බාගයක් ඒ කානුව වහල තියෙන ලෑල්ලට හේත්තු වෙන්නත් අනිත් කොටස ඉස්සරහට හෙත්තුවෙන්නත් තියලා ආසන පැනෙව්වා. ආසන හදල හොඳට වහල නිගණ්ඨයන්ව මහා පෙරහැරකින් වඩම්මවාගෙන ඇවිල්ලා ආසන දුන්න වාඩි වෙන්න කියල. එතකොට වාඩි වෙන වාඩි වෙන එක්කෙනා ඒ කාණුවට වැටුනා. ඒ පිරිස කිව්වා නිගණ්ඨයන්ට දැන් බලය පෙන්නන්නනේ ආවේ බලය පෙන්නන්න කියල. (මේකේ තව දිග කථාවක් තියෙනවා) ඊට පස්සේ මිනුස්සු බොරු කල නිසා ඒ වලට වැටිච්ච නිගණ්ඨයන්ට ගැහුවා. ඒ ගොල්ලෝ පැනල දිව්වා. හැබැයි ඒ දායකයෝ කිව්වා ඒ කරපු වැඩේ හොඳ නෑ කියල. එතකොට ඒ සංවිධානය

කරපු සල්ලිකාර දායකය කිව්වා 'ඉතිං දිව්‍යලෝකේ ජේනවනම් - කල්ප ගණන් ඈතට ජේනවා නම් - අතීතයේ වෙච්ච දේවල් ජේනවා නම් මේ කන්න ආපු තැන වල පෙන්නේ නැත්ද' කියල. ඔය පරික්ෂා කරන්න කරපු වැඩ . ඒ කාලෙත් ඒ වගේ ඒවා කරලා තියෙනවා. ඊට පස්සේ බුදුරජාණන්වහන්සේ වඩම්මවලා මේ අය විශේෂ දානයක් දුන්නා.

දැන් අපි කියමින් හිටියේ කෝතුහල මංගලිකයෝ ගැන. ආර්ය ශ්‍රාවකයෝ සාස්තර පස්සේ යන්නේ නැති බව.

ආර්ය ශ්‍රාවකයන්වහන්සේ නමක් තුල ඒ ආර්ය ධර්ම පිහිටියාට පස්සේ උන්වහසේලාගේ සිත්තුල ඇතිවිය හැකි දේවල් සහ ඇතිවිය නොහැකි බොහෝදේ බුදුරජාණන්වහන්සේ ශ්‍රාවකයන්ට දේශනා කළා. ඒ දේශනාවල් එසේ දේශනා කරපු නිසා තමයි බුදුරජාණන්වහන්සේ සිහිපත් කරේ 'මගෙන් පස්සේ ඔබලා අනාථ නෑ - අසරණ නෑ - ශාස්තෘ කෘත්‍ය කරන්න මේ ධර්මය තියෙනවා' කියල. ඒකනිසා මේ ධර්මය හොඳට ඉගෙන ගන්න ඕනෑ. ඒවාගේම කියවන්න ඕනෑ. එතකොට තමයි අපිට මුලා වෙන්නේ නැතුව සම්මා ද්ට්ඨියෙන් යුක්තව මාර්ගයෙහි ගමන් කරන්න පුළුවන් වෙන්නේ. මේක තේරුනාද?

## සංඝ භේදය




සංඝ භේදය ගැන කථා කිරීමේදී 'සංඝයා' යනුවෙන් අදහස් කෙරෙන්නේ උපසම්පදා භික්ෂූන් වහන්සේලා පමණයි. අපි හිතමු ස්වාමීන්වහන්සේලා සිය නමක් පමණ ඉන්නවා කියල. එතන සෝවාන් සකෘදාගාමි අනාගාමී අරහත් හෝ පෘතක්ජන භික්ෂූන්වහසේලා ඉන්න පුළුවන්. හැබැයි සියලුදෙනා වහන්සේලා උපසම්පදා භික්ෂූන් වහන්සේලා විය යුතුයි. අපි හිතමු අවුරුදු 7 ක් වයස ඇති රහතන්වහන්සේ නමක් වැඩ ඉන්නවා කියල. ඒ ස්වාමීන්වහන්සේට උපසම්පදාව නෑ. නමුත් මෙතැනදී ඒ රහතන්වහන්සේ සංඝ ගණයට අයිතිවෙන්නේ නෑ. ආර්ය සංඝ ගණයට අයිති වෙනවා නමුත් මේ අපි සංඝ භේදය ගැන කථා කිරීමේදී සංඝ ගණයට අයිති වෙන්නේ නෑ. උපසම්පදා වෙන්න අවුරුදු 20 ක් සම්පූර්ණ වෙන්න ඕන. බුදුරජාණන්වහන්සේගේ ප්‍රඥප්තියට කලින් සෝපාක ස්වාමීන්වහන්සේ අවුරුදු 7 න් උපසම්පදා වෙලා තියෙනවා. **'ඤත්තිචතුත්ථ කම්ම'** කියල විනය කර්මයක් තියෙනවා. ඒ ඤත්තිය සහිත චතුත්ථ විනය කර්මය කරලා


උපසම්පදා කරපු භික්ෂුන් වහන්සේට නීති ගොඩක් සීමාවේදී දෙනවා. ඒ ටික දිවි හිමියෙන් රකින්න ඕනේ නැත්නම් ප්‍රතික්ෂේප කරලා යන්න පුළුවන් කරන්න බෑ කියල. ඒක ඒ ඒ ස්වාමීන්වහන්සේගේ කැමැත්ත අනුව තීරණය වෙන දෙයක්. ඒ ස්වාමීන්වහන්සේලා ඔක්කොම සංඝ ගණයට අයිති වෙන්නේ - හේතුව ඒක ආර්ය සීලයක්. උපසම්පදා සීලය කියල කියන එක සිල්ලර පහේ සාමාන්‍ය සීලයක් නොවේ. ලොව්තුරා බුදුරජාණන්වහන්සේ සඳහන් කරපු ශික්ෂාවන්ට අනුකූලව උපසම්පදා ස්වාමීන්වහන්සේලා එක්කාසුවෙලා පිරිසිඳු සීමාව - පිරිසිඳු කර්ම වාක්‍ය සජ්ඣායනාව තුලින් නියම විනය කර්මයක් හරහා උපසම්පදාව ඉල්ලු සාමණේර ස්වාමීන්වහන්සේ කෙනෙකුට තමයි ඔය උපසම්පදාව හම්බ වෙන්නේ. දැන් මෙතන සිය නමක් ඉන්නවා කියමු. මේ සිය නම හැම පොහොයකටම එකතුවෙන්න ඕනේ විනය කර්ම කරන්න - මාසේ පෝයටයි පසළොස්වකටයි. ඒකට කියනවා සීමාව (සීමා ගේ ) කියල. ඒ ගේ වටේට හිටවලා තියෙනවා සීමා ගල් 16. ඒක තමයි සීමාව. උපසම්පදා විනය කර්මයක් කරන කොට ඕකේ අස්සේ ඉන්න ඕන සියලුදෙනාම. දැන්, උපසම්පදා කරන කොටත් මේකේ ඇතුලේ - පෝය කරන කොටත් මේකේ ඇතුලේ - ඔක්කොම හාමුදුරුවරුන්ගේ තීරණ ඔක්කොම කටයුතු කරන්නනේ සීමා ගෙය ඇතුලේ. ඒ ස්වාමීන්වහන්සේලා සිය දෙනාම එම සීමා ගෙය ඇතුලට එන්න ඕනේ. එන්න බැරිනම් අසනීපයක් නම් ඡන්දය ප්‍රකාශ කරලා එවන්න ඕනේ.

දැන් අපි හිතමු මෙහෙම - සමහර වෙලාවට 'සංඝ' වශයෙන් සැලකීමට අවම වශයෙන් උපසම්පදා භික්ෂුන් වහන්සේලා 4 නමක්වත් වැඩ සිටිය යුතුයි. උපසම්පදා හාමුදුරුවරු තුන් නමක් හිටියොත් සංඝ කර්මයක් කරන්න බෑ. හතර නමක් ඉන්න ඕනේ. එතකොට 4 නමක් තමයි අවම සංඛ්‍යාව සංඝ ගණයට අයිති වෙන. දැන් කඨින වස්ත්‍රයක් පූජා කරන කොට භික්ෂුන්වහන්සේලා 5 ක් අවශ්‍යයයි. එහෙම 5ක් අවශ්‍ය වෙන්නේ භික්ෂුන් වහසේලා 4 නමක් ඉන්නවා - ඒ සිවුර 5 නමකට හම්බ උනේ. පස් නමක් හෝ ඊට වැඩි ප්‍රමණයක් හිටියත් කමක් නෑ. දැන් මේ සිවුර පවරනවා - සංඝයාගෙන් තමයි පසුව ඒ සිවුර තනි හාමුදුරුවෝ කෙනෙකුට ලැබෙන්නේ. එතකොට සංඝයා හැටියට නියෝජනය වෙන්න 4 නමක් අවශ්‍යයයි. මේ සංඝයා දෙන්නාවූ සිවුර ලබන්න තව හාමුදුරුවෝ කෙනෙක් අවශ්‍යයි. එතකොට කඨින සිවුරක් පැවරීමේදී කී නමක් අවශ්‍ය යිද? 5 නමක් අවශ්‍ය යි. හාමුදුරුවෝ 4 නමක් පමණක් ඉන්න අවස්ථාවකදී දායකයන්ට කඨින සිවුරක් පූජා කරන්න පුළුවන් හැබැයි පවරන්න බෑ. මිනුස්සුන්ට පින් සිද්ධ වෙනවා


හැබැයි කඨින චීවරය පවරන්න බෑ මොකද හාමුදරුවෝ ඉන්නේ 4 නමක් පමණ නිසා. මේක හැබැයි විනය point එකක්.

(මේක විනය කථාවක්. ලංකාවාසි ලෝකවාසි ස්වාමීන්වහසේලා අහගෙන ඉන්නවානම් මීට වඩා කියන්න කියල මම record එකට  කියනවා. නමුත් මේක ධර්මය පැහැදිලි කිරීමට කරන විග්‍රහයක්.)

ඊළගට තියෙනවා මෙහෙම. අපි හිතමු  සීමාවකට ගිහිල්ල භික්ෂුන් වහන්සේලා වාඩි වෙනවා. ඒ සීමාව ඇතුලේ හාමුදුරුවරු ඉන්නවා අපි හිතමු 21. මේ හාමුදුරුවරු 21 දෙනා විනය කර්මයක් කරන්න යනවා. මත භේදයක් හැදිලා මේ හාමුදුරුවන්ගෙන් එක උපසම්පදා හාමුදුරුවෝ කෙනෙක් කියනවා 'මම ඕකට කැමති නෑ විරුද්ධයි කියල' ටිකක් ඈතට යනවා. දැන් ඉන්නේ 20 දෙනයි. (පළමුවෙනි රූප සටහන)




දැන් මේ  හාමුදුරුවෝ කරන්නේ අර සංඝයා වහන්සේලා 20 දෙනාගෙන්  4 ට වැඩි සංඛ්‍යාවක් බෙදනවා. අපි හිතමු 5 ක් කියල. එතකොට දැන් ඉතුරුවෙලා ඉන්නේ සංඝයා වහන්සේලා 15 දෙනයි. අර හාමුදුරුවෝ ගත්ත 5 දෙනෙක්. (දෙවෙනි රූප සටහන)





දැන් ඒ හාමුදුරුවෝ කරපු දේ තමයි ඒ සමඟිව සිටි භික්ෂු පිරිස 15 දෙනෙක් වශයෙන් සහ 5 දෙනෙක් වශයෙන් බෙදපු එක. එතකොට තමයි සංඝ භේදය නම් වූ ආනන්තර්ය පාප කර්මය සිදු වෙන්නේ. මේක කරන්න පුළුවන්කම තියෙන්නේ උපසම්පදා භික්ෂූන්වහන්සේට පමණයි. ගිහියන්ට සංඝ භේදය කරන්න බෑ. උපසම්පදා භික්ෂුන් වහන්සේත් සීමාවක් ඇතුලත වෙන්න ඕන. හැබැයි සංඝ භේදය එළියේ plan කරලා ඇතුලට ගිහිල්ල වැඩේ කරන්න පුළුවන්. සංඝ භේදය වෙන්න මේ ඉහත සඳහන් කරුණු සියල්ලම අවශ්‍ය යයි.

ස්වාමීන්වහන්ස එතකොට මාර්ගඵල ලාභී භික්ෂුන් වහන්සේලාම වෙන්න ඕනේ නෑ උපසම්පදාව පමණයි අවශ්‍ය වන්නේ.

ඔව් දැන් ලංකාවේ හැටියට සංඝ භේදය කියන එක ඔය ඕනෑම සීමාවක වෙන්න පුළුවන්. රාමඤ්ඤ නිකායේ සීමාවේ වෙන්න පුළුවන් - මල් වත්තේ සිමාවේ වෙන්න පුළුවන් - අස්ගිරියේ සිමාවේ වෙන්න පුළුවන් - දකුණු පළාතේ සිමාවේ වෙන්න පුළුවන් - අපේ අමරපුර ඒ ගෞරවණීය ස්වාමීන්වහන්සේලාගේ සිමාවේ වෙන්න පුළුවන් - ඕනෑම තැනක වෙන්න පුළුවන්. ඒකත් බරපතල කරුණක් සම්බන්ධයෙන් දෙකට කැඩෙන්න ඕන. එතකොට තමයි මේ සංඝ භේදය සිද්ධ වෙන්නේ.

අපි හිතමු මෙහෙම. හාමුදුරුවෝ 8 දෙනෙක් ඉන්නවා. එයින් එක හාමුදුරුවෝ කෙනෙක් සංඝ කර්මයක් සම්බන්ධයෙන් විරසක වෙලා අහකට යනවා. දැන් ඉන්නේ 7 නමයි. විරසක වෙච්ච හාමුදුරුවන්ගේ පැත්තට තව හාමුදුරුවරු 3 නමක් යනවා.




දැන් මුලින් හිටපු සංඝයාගෙන් දැන් ඉතුරුවෙන්නේ 4 නමයි. (තුන්වෙනි රූප සටහන) නමුත් අර විරසක වෙච්ච හාමුදුරුවන්ට ආනන්තර්ය පාප කර්මයක් වෙන්නේ නෑ. හේතුව ඒ පැත්තේ ඉන්නේ 4 දෙනා නිසා. එතන 4 දෙනෙක් වෙන්නේ පළමුව විරසක වෙච්ච හාමුදුරුවොත් එක්ක. එතකොට සංඝ භේදය වෙන්නේ නෑ. සංඝ භේදය වෙන්න නම් එතන ඉන්න ඕන හාමුදුරුවෝ 9 දෙනෙක්. 9 දෙනාගෙන් එක්කෙනක් අයින් වෙනවා. එතකොට ඉතිරි වෙන්නේ 8 නමයි. මෙන්න මේ 8 දෙනා හරියට දෙකට කඩනවා. අන්න එතකොට සංඝ භේදය වෙනවා. සංඝ භේදයට භික්ෂූන් වහන්සේලා සිටිය යුතුයි අවමයෙන් 9 නමක්. එය සීමාවක් ඇතුලත වෙන්න ඕනේ. අනිත් එක තමයි හොඳට උපසම්පදා සීලයෙහි පිහිටියාවූ - හොඳින් විනය කර්ම කිරීමට පුළුවන් - නියම විනයෙහි පිහිටියාවූ සීමාවක වෙන්න ඕනේ. ඒකට අදාළ කාරණයක් මුල් වෙන්න ඕනේ. එතකොට තමයි සංඝ භේදය වෙන්නේ. ගිහි අයට සංඝ භේදය කරන්නත් බෑ. සාමණේරයන්ට සංඝ භේදය කරන්නත් බෑ.

සංඝ භේදය වෙච්ච එකම කාරණය තමයි දෙව්දත් තෙරුන්වහන්සේ. කේලම් කියල මිනුස්සු බිඳවන එක වෙනයි. ඒක ආනන්තරිය පාප කර්මයක් වෙන්නේ නෑ. පංචානන්තරිය කර්මයක් වෙන්නේ නෑ කියල කේලම් කියල බිඳවන්ටත් හොඳ නෑ. මේක තේරුනාද?

<u>පොහොය ගෙය</u> - බුදුරජාණන් වහන්සේ දේශනා කරපු ‘සීමාවක්’ හදනවා කියන එකත් ලේසි නෑ. සීමාවක් හදනවා කියල කියන්නේ ලොකුම ලොකු විශාල project එකක්. උපසම්පදා හාමුදුරුවෝ වඩම්මවලා විනය කර්ම කරලා අදිෂ්ඨාන කරලා ඒවගේම ඒකට සුදුසු දිග පළල තිබෙන ගල් පුවරු 16 ක් ඕනේ. ඒවගේ ලොකු වැඩ පිළිවෙලක් තියෙනවා.

<u>ආර්යන් වහන්සේලාගෙන් සමාව ගැනීම</u> - මම මීට ඉස්සෙල්ලත් අපේ පිරිසට මතක් කරලා තිබෙනවා භාවනා කරන්න කලින් සෝවාන් - සකෘදාගාමී - අනාගාමී - අරහත් කියන ආර්යන් වහන්සේලාට බුදු -පසේ බුදු - මහා රහතන් වහන්සේලාට මගේ සිතින් - මගේ කයින් - මගේ වචනයෙන් දැනුව හෝ නොදැනුවත්ම යම්කිසි ආර්ය උපවාදයක් - වචනයක් - වැරදීමක් සිද්ද උනානම් පළමුවත් දෙවනුවත් තුන් වෙනුවත් මට සමාව දෙන සේක්වා කියල සමාව ගන්න කියල මම කියල තියෙනවා. ඒක එහෙම කරන්න ඕන. එතකොට ආර්ය උපවාදයක් තියෙනවනම් ඒකෙන් අපි පිරිසිඳු වෙනවා. හැබයි හාමුදුරුවන්ට දොස් කියන්න හොඳ නෑ. හාමුදුරුවන්ට දානේ වලක්වන්ට හොඳ නෑ. මම ඇත්තටම කියන්නේ ඔය සමහර සෝවාන් සකෘදාගාමී අනාගාමී වෙච්ච අය කියල කියන මිනිස්සු පන්සල් වලට යන එක වළක්වනවා. දානේ දෙන එක වළක්වනවා. එහෙම කරනවනේ. බුදුරජාණන්වහන්සේ අර උපාලි ගෘහපතියට කිව්වා ‘ඔයා ධර්මය අවබෝධ කරගත්ත - ධර්මයට ආව - ඒ කථාව වෙනයි, හැබැයි නිගණ්ඨයන්ට කන්න දෙන එක නවත්වන්න එපා’ කියල. එතකොට ඒ කෑම කන අය නිගන්ඨයොනේ. ඒ අයටත් කන්න දෙන එක නවත්තන්න එපා කිව්වා. නමුත් අද කාලේ මාර්ගඵල අවබෝධකර ගත්තා යයි කියන අය හොඳටම දන්නවා මම, භික්ෂූන්වහන්සේලාට සලකන එක වැඩක් නෑ - ඵල ප්‍රයෝජනයක් නෑ - දෙන්න එපා කියන අය ඉන්නවා. ඒ මුලාව නැති කරගන්න තමයි මේ බුදුරජාණන් වහන්සේගේ සූත්‍ර දේශනාවල් අපි මේ පින්වතුන්ට මතක් කරන්නේ.

හොඳයි සැම දෙනාටම තෙරුවන් සරණයි ධර්ම අවබෝධ වේවා!

**සාධූ! සාධූ! සාධූ!**



ඉහත සඳහන් ධර්ම දේශනාව

අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.